මහව ප්‍රාදේශීය සභාව
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 09දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 17 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව2012 ඔක්තෝබර් 11දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහව ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.37,789,647ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙසසන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,254,379 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.7,958,594 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). 2010 වර්ෂයේදී ණයගැතියන් හා ණයහිමියන් අධි ප්‍රතිපාදනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල ජනල් සටහන් අංක 49 මගින් ණයගැතියන් රු.15,028,377 ක්ද ජනල් සටහන් අංක 44 මගින් ණයහිමියන් රු.13,755,685 ක්ද සමුච්චිත අරමුදලට එරෙහිව කපා හැර තිබුණි.

(ආ). පෙර ගෙවුම් යටතේ අත්තිකාරම් ලෙසවර්ෂ ගණනාවක සිට පැවත එන රු.6,098,770 ක් නිරවුල් නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පැවති අතර ඒ සඳහා උපලේඛන ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 03 ක ට අදාලවසමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 53,722 ක් වටිනා චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 2,856 | 2,908 | 1,828 |
| (ii). | බදුකුලී | 6,395 | 6,633 | 213 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 216 | 226 | - |
| (iv). | වෙනත් ආදායම් | 38,365 | 24,901 | 15,748 |

### 2.3.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ප්‍රමාණය රු.5,483,966 ක් විය.

### 2.3.3 සභා දේපල බදුදීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාවේ වත්කම් බදුදීම් වලට අදාල 1982 සිට 2009 දක්වා අවස්ථා 12 ක් යටතේ අයවිය යුතු රු.256,517 ක හිඟ බදුකුලී හා අවස්ථා 3 කට අදාල රු.37,131 කඩකුලී පැවති අතර ආදායම් ලේඛන වලින් මින් රු.256,517 කට අදාල විස්තර හඳුනාගත නොහැකි විය.

(ආ). අවම ලංසුව රු.328,051 ක් වූ වත්කම් 12 ක් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදීමට නොහැකි වී තිබූ අතර, රු.144,708 කට බදුදී තිබූ මහව අංක 2 මාළු ලැල්ල බදුකරු ඉදිරිපත් කර තිබූ ලිපිය අනුවසභාවේ තීරණය මත බදු ගිවිසුම අවලංගු කිරීමෙන් පසු 2011 මාර්තු මසසිට මුදල් අයවී නොතිබුණු අතර, නැවත බදුදීමට ද නොහැකි වී තිබුණි.

### 2.3.4 මෝටර් ග්‍රේඩරය බදුදීම

2010 මාර්තු මාසයේදී රු.16,446,400 කට මිලදී ගෙන තිබූ මෝටර් ග්‍රේඩරය මීටර් පැයකට (බදු සහිතව) රු.2,576 ක කුලියකටත් දිනකට අවම මීටර් පැය 6 ක් හා දින 25 ක් තුල යන්ත්‍රය සඳහා මාසික කුලී ගාස්තුව ලෙස රු.386,400 ක අවම ගාස්තුවක් ගෙවීමේ කොන්දේසි මත පාදෙණිය අනුරාධපුර මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරු සමඟ 2010 ජූලි 6 දින වර්ෂයක ගිවිසුමට එළඹ 2011 ජූනි මස නැවත එය අළුත් කර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය විය.

(i). 2011 මාර්තු මස මිටර් පැය 161.10 යෙදවීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව රු.414,994 ක් ඉන්වොයිස් කලයුතු වුවද රු.368,081 ක මුදල ක් ලබාගෙන තිබුණි.

(ii). අදාල ගිවිසුමේ 9 කොන්දේසිය ප්‍රකාරව මාසික කුලී ගාස්තු වශයෙන් දිනකට පැය 06 බැගින් දින 25 සඳහා රු.386,400 ක කුලී ගාස්තුවක් මාසිකව තැන්පතුවක් ලෙස බදුකරු විසින් ගෙවිය යුතු වුවත්, සභාව විසින් ඉන්වොයිස් පිළියෙල කිරීමේදී මෙකී කොන්දේසිය ප්‍රකාරව කටයුතු නොකර තත්‍ය ලෙස ඒ ඒ මාසවල සේවයේ යෙදවූ පැය ගණන පදනම්ව ඉන්වොයිසි පිළියෙල කර තිබුණි. ඒ හේතුවෙන් 2010 ජූලි සිට 2011 ජූනි කාලයට අදාලව රු.1,073,323 ක් අඩුවෙන් කුලී ගාස්තු ඉන්වොයිස් කර තිබුණි.

2.4 <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2007 මිලදීගෙන තිබූ රු.97,500 ක් වටිනා කසල බඳුන් 30 ක්ද 2010 වර්ෂයේ මිලදීගෙන තිබූ රු.19,320 ක් වටිනා කොම්පෝස්ට් බඳුන් 8 ක් හා රු.9,250 ක් වටිනා මීමැසි පෙට්ටි 10 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද බෙදාහැර නොතිබුණි.

(ආ). මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි සමිති වලට බෙදාහැරීම සඳහා 2010 හා 2011 වර්ෂයන් හිදි මිලදීගෙන තිබූ පුටු 2447 කින් පුටු 1660 ක්සමිති වලට නිකුත් කර තිබූ අතර, 2012 අගෝස්තු වන විටද රු.457,592 ක් වටිනා පුටු 787 ක් බෙදාහැර නොතිබුණි.

(ආ) සෘජු ශ්‍රම පදනම යටතේ සිදුකර තිබූ මහව බස්නැවතුම්පොළ ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව 2010 වර්ෂයේ සිට පැවත එන රු.541,322 ක තොග ශේෂයක් වූ අතර පසුව 2010 ජූලි 10 දින මෙම ඉදිකිරීම කොන්ත්‍රාත් පදනම මත ඉටු කිරීම සිදුකර තිබුණද අදාල ඉතිරි තොගයන් කොන්ත්‍රාත්කරුට භාරදීමක් හෝ සභාව වෙත ලබාගැනීමක් සිදුව නොතිබුණි. 2011 නොවැම්බර් මසකාර්මික නිලධාරි වාර්තාව අනුව මෙකී ඉතිරි තොගය ලෙස රු.57,888 ක තොගයක් පමණක් පැවති අතර එකී තොගය 2012 වර්ෂයේ දී කොන්ත්‍රාත්කරුට ලබාදී තිබුණි.

2.5 <u>මානවසම්පත් කළමනාකරණය.</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාවේ තනතුරු නාම 10 ට අදාලව සේවකයන් 17 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර මෙම පුරප්පාඩු වසර 10 කටත් වඩා වැඩි කාලයක සිට පවතින ඒවා වූ අතර, අනුමත කාර්මික නිලධාරි තනතුරු 3 න් 2 ක්ද ආදායම් පරිපාලක තනතුරු 3 න් 1 ක්ද පුස්තකාලයාධිපති තනතුරු 5 න් 3 ක්ද සමාලෝචිත වර්ෂය වන විට පුරප්පාඩුව පැවතුණි. 2012 සැප්තැම්බර් 26 දිනැති ප්‍රාදේශිය සභා සභාපතිගේ කරුණු පැහැදිලි කිරීම් අනුව අදාල බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් මෙකී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව දක්වා තිබුණි.

(ආ). කළමනාකරණ සහකාර සේවයේ අධි පංතියේ තනතුරක් වූ ලේකම් තනතුර දිගුකාලයක සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබුණු අතර, 2011 අප්‍රේල් 27 දින සිට එකී තනතුර සඳහා වාරියපොල ප්‍රාදේශීය සභාවට අනුයුක්ත ලේකම් විසින් සතියට දින 2 ක් වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඇ). කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පුස්තකාල කම්කරුවන් 3 දෙනෙකු අනුමත කර තිබුණද ඒ සඳහා ස්ථිර සේවකයින් 4 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. එමෙන්ම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය කිරීම මත පළාත් පාලන නිලධාරීන් 10 දෙනෙකු සභාවට අනුයුක්ත කර තිබුණමුත් අනුමත නිලධාරීන් සංඛ්‍යාව දක්වා නොතිබුණි. සභාවේ සේවකයන් 4 දෙනෙකු තමන් බඳවාගත් තනතුරින් බැහැරව වෙනත් කාර්යන්හි යොදවා තිබුණ අතර, ආදේශක මුරකරුවන් 4 දෙනෙකු, ආදේශක පුස්තකාල කම්කරුවන් 4 දෙනෙකු ලෙස මුලු සේවකයන් 8 දෙනෙකු සභාවෙන්වැටුප් ගෙවීම් පදනම මත සේවයේ යොදවා තිබණි.

(ඇ). අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව කාර්යාල කාර්ය සහායක තනතුරු 2 ක් හා කාර්යාල කම්කරු තනතුරු 2 ක් පැවති අතර, වැටුප් ප්‍රතිපූරණ ඉල්ලුම් කිරීමේදී කාර්යාල කාර්ය සහායක ලෙස දක්වා කම්කරු තනතුරු 2 ක සඳහාද, වැටුප් ප්‍රතිපූර්ණ ලබාගෙන තිබුණි. එමෙන්ම වැටුප් ප්‍රතිපූර්ණ ලබාගත් ස්ථිර කම්කරු තනතුරට අදාලව විස්තර ස්ථිර කාර්ය මණ්ඩල විස්තරයට ඇතුලත්ව නොතිබුණි.

(ඉ). 2010 නොවැම්බර් හා 2011 පෙබරවාරි කාලය තුල සේවා ගිවිසුම් මත සේවකයන් 13 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඔවුන්ගේ සේවා කාලය 2011 අගෝස්තු මාසයේදී අවසන්ව පැවතුනද, නැවත සේවා ගිවිසුම් අළුත් නොකර ඔවුන් සේවයේ යොදවා ගෙන වැටුප් ගෙවා තිබුණි. 2012 සැප්තැම්බර් 26 දිනැති ප්‍රාදේශිය සභා සභාපතිගේ කරුණු පැහැදිලි කිරීම් අනුව නව ගිවිසුම් වලට නොඑළඹෙන ලෙස දන්වා තිබූ උපදෙස් අනුව කටයුතු කළ බව දක්වා තිබුණි.

(ඊ). කම්කරු, මුරකරු වැනි තනතුරු නාම යටතේ අනුමත තනතුරු සංඛ්‍යාව 58 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒ යටතේ 43 දෙනෙකු පමණක් ස්ථිර සේවයේ යෙදී සිටියද අනියම්, ආදේශක පදනම මත සහා අරමුදලින් වැටුප් ලබන 21 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවට බඳවාගෙන තිබුණි.

2.6 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති හා මහව ප්‍රාදේශීය සභාවේ සභාපති අතර සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රු.3,871,132 ක් වටිනා ගිවිසුමකට 2011 ජනවාරි 04 අත්සන් තබා තිබුණ අතර ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(I). 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 3 වගන්තිය ප්‍රකාරව උක්ත ගිවිසුම සඳහා සභාවේ පොදු මුද්‍රාව යොදා නොතිබූ අතර, ව්‍යාපෘතියේ සියලු වැඩ 2011 අප්‍රේල් 04 දින නිමකල යුතු බව උක්ත ගිවිසුමේ 2.23 වගන්තියෙන් දක්වා තිබුණද, අදාල 20% අත්තිකාරම් මුදල ලෙස රු.774,226 ක් සභාව වෙත ලැබී තිබුනේද 2011 ජුනි 30 දිනදී වන අතර එකී මුදලද කර්මාන්ත ගිණුමේ තැන්පත් කර තිබුණි.

(II). අදාල ඉදිකිරීම් කටයුතු සඳහා 2011 ජූලි 22 දින පුවත්පත් මගින් විවෘත ටෙන්ඩර් කැඳවීම් කර තිබුණු අතර ලැබී තිබුණු එකම ටෙන්ඩරය හියුරන් කොන්ත්‍රාත්කරුවන් වූ අතර 2011 සැප්තැම්බර් 27 දින රැස්වූ ඇගයීම් කමිටුවෙන් 'සාරානුරූපීව' ප්‍රතිචාර දක්වා නොමැති නිසා එයද ප්‍රතික්ෂේප කර නැවත ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීමිත ටෙන්ඩර් කැඳවා තිබුණු අතර, ඒ සඳහා ලැබී තිබුනේද උක්ත ප්‍රතික්ෂේප වූ ටෙන්ඩර්කරුගේ ටෙන්ඩර් පත වූ අතර ඇගයීමට ලක් කරන ලද ලංසු මිල රු.3,982,801 ක ටෙන්ඩර් වටිනාකමක් වූ අතර ඇගයීම් කමිටු නිර්දේශය මත රු.3,803,016.08 කට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නිර්දේශ කර තිබුණි.

2.7 <u>මෙහෙයුම් /කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ රීති අංක 218 ප්‍රකාරවසභාවේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.30,578,638 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි කාලානුරූපීවසමීක්ෂණයට ලක්කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුවවාර්තා වී තිබූ අස්ථාන ගත බවසඳහන් රු.20,207 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධව විගණන දින වන විටත් (2012 අගෝස්තු) අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ). ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලවසභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 3,534,989 ව තිබුණි.එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 11,193 බැගින් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

2.8 <u>කාර්ය සාධනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය මගින් සුසානභූමි සංවර්ධනය සඳහා රු.72,000 ක්ද, ක්‍රීඩා පිටි සංවර්ධනය සඳහා රු.100,000 ක් හා මාතෘ හා ළමා සෞඛ්‍ය සඳහා රු.50,000 ක්ද වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එකී කාර්යයන් ඉටුව නොතිබුණි.

(ආ). ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග පද්ධතීන් රු…9,586,816 කපිරිවැයක්දරා සමාලොචිතවර්ෂයතුලනඩත්තුකරතිබුණඅතරමප්‍රාදේශීයසභාවට අයත් සුසාන භූමි 12 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු…600,000 ක නඩත්තු පිරිවැයක් දරා තිබුණි.

(ඇ). ආයතනයට අදාලවසංයුක්ත සැලැස්මක් හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මක් නොතිබුණි. සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල එකී කිමිටුව අවස්ථා එකකදී රැස්වී තිබුණි. එහෙත් අභ්‍යන්තර විගණන වැඩසටහන් යටතේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). මූල්‍ය පාලනය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමණාකරණය

(ඉ). කොන්ත්‍රාත් පරිපාලනය